**Press Release**

ADFACTORS PR
Knowledge-driven communications

## Airtel Sri Lanka’s Fastest වේග පන්දු යවන්නන්ට මොකද වුණේ ?

ශ්‍රී ලංකාවේ අනාගත වේගපන්දු යවන්නන් සොයා යාමේ “Airtel Sri Lanka’s Fastest” මෙහෙයුමේ අවසානය සනිටුහන් කරමින් මීළඟ පරම්පරාවේ දක්ෂතම වේගපන්දු යවන්නන් තිදෙනා නම් කිරීම එයාර්ටෙල් ලංකා ආයතනය විසින් පසුගියදා සිදු කරන ලදී. Derana TV සමග සහයෝගිත්වයෙන් මාස 9 ක් පුරා දිස්ත්‍රික්ක 11 ක් ආවරණය කරමින් සිදුකරන ලද මෙම එයාර්ටෙල් ෆාස්ටස්ට් මෙහයුමේ මූලික අදියර සඳහා තරඟකරුවන් 10000 කට අධික පිරිසක් සහභාගි විය.

ශ්‍රී ලංකාවේ යෝකර් රජු ලෙස විරුදාවලිය ලත් ලසිත් මාලිංග මෙහිදී අදහස් දක්වමින් කියා සිටියේ මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාතික කණ්ඩායම නියෝජනය කිරීමට මාවතක් සකසා ගැනීමට මෙය හොඳ අවස්ථාවක් වූ බවයි. එය සනාථ කරමින් පැ කි.මි.104 ක වේගයක් වාර්තා කරමින් ”එයාර්ටෙල් ශ්‍රී ලංකා ෆාස්ටස්ට්” තරඟයේ කාන්තා විවෘත අංශයේ ශූරතාව දිනූ ශයනි සේනාරත්න ක්‍රීඩිකාව කාන්තා නැගී එන කණ්ඩායමේ සාමාජිකයන් 15 දෙනාගේ සංචිතයට ඇතුළත් කිරීමෙන් පසු 2019 ACC කාන්තා නැගී එන කණ්ඩායම් ආසියා කුසලාන තරගාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා තෝරාගෙන තිබේ. එසේම කාන්තා විවෘත කාණ්ඩය නියෝජනය කරමින් අනුශූරතාවය දිනාගත් මල්ෂා මධුෂානි ද මෙම දකුණු ආසියානු තරඟාවලිය සඳහා තේරී පත්වී ඇත

එසේම අනෙකුත් දක්ෂතා දැක්වූ ක්‍රීඩකයන්ට ලංකාවේ පිළිගත් ක්‍රීඩා සමාජ මගින් ඇරයුම් ලැබී ඇති අතර ,පැ .කි.මි.141ක උපරිම වේගයක් වාර්තා කරමින් එයාර්ටෙල් ෆාස්ටස්ට් හි සමස්ත ශූරතාව දිනූ 19 න් පහළ කාණ්ඩය නියෝජනය කළ එෂාන් මාලිංග මේ වන විට CCC ක්‍රීඩා සමාජය වෙනුවෙන් ක්‍රීඩා කරනු ලබයි.

එසේම 19 න් ඉහළ කාණ්ඩයේ ශූරතාවය හිමිකරගත් පැ .කි.මි.140 ක වේගයක් වාර්තා කළ මලිඳු ෂෙහාන් BRC ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා කරනු ලබන අතර එහි අනුශූරතාවය දිනූ මොහමඩ් ෆහීම් පොලිස් ක්‍රීඩා සමාජය සඳහා තෝරාගෙන තිබේ.

මීට අතිරේකව අවසන් 14 දෙනාට තේරී පත් වූ 19 න් ඉහළ කාණ්ඩය නියෝජනය කළ රසාංජන අරවිඳු, ටැමිල් යුනියන් ක්‍රීඩා සමාජයත් අරුන් ප්‍රකාශ් මුවර්ස් ක්‍රීඩා සමාජයත් නියෝජනය කරනු ලබන අතර රසාංජන අරවිඳු සම්පත් බැංකු කණ්ඩායම ද නියෝජනය කරනු ලබයි.එසේම 19 න් පහළ කාණ්ඩය නියෝජනය කළ චිරාන් තීක්ෂණ සහ මලීෂ දුරන් මේ වන විට BRC Burgher Recreation Club ක්‍රීඩා සමාජය නියෝජනය කිරීම සඳහා තෝරාගෙන ඇති අතර ජනිත් මධුෂාන් රාගම ක්‍රිකට් කණ්ඩායමට තේරී පත්වී තිබේ.